05-01-2026 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්

**සාරය:** සුමිහිරි දරුවනි, බාබාගේ ශ්‍රීමත් පිළිපැදීම මඟින් ඔබ සාමාන්‍ය මනුෂ්‍යයෙක්ගෙන් දේවී දේවතා තත්ත්වයට පත් වේ. ගීතාව සහ රාජයෝග පිළිබඳ දැනුම ඔබව සම්පූර්ණයෙන්ම පාරිශුද්ධ කරවයි.

**ප්‍රශ්නය:** ස්වර්ණමය යුගයේ දී සියලු දේ හොඳම හා සතෝප්‍රධාන් වන්නේ ඇයි ?

**පිළිතුර:** එහි මනුෂ්‍යයින් වශයෙන්ම ඔවුන් සතෝප්‍රධාන් නිසාය. මිනිසුන් හොඳ වන විට ඔවුන් අවට සියලු දේද හොඳ වන අතර ඔවුන් නරක වන විට ඔවුන් අවට සියලු දේ විනාශකාරී වේ. සතෝප්‍රධාන් ලෝකයේ දී නොලැබිය හැකි දෙයක් නැති අතර කිසිවකුගෙන් කිසිවක් ඉල්ලීම අවශ්‍ය නොවේ.

ඕම් ශාන්ති. බාබා මෙම ශරීරය මඟින් විස්තර කරයි. මොහු ජීවත් වන කෙනෙක් යැයි කියන අතර එහි ඔහු තුළ ජීවාත්මයක් ඇතැයි කියයි. ඔබ දරුවන් දන්නවා උත්තරීතර පියා වන උත්තරීතර ජීවාත්මය මොහු තුළ සිටිනා බව. පළමුවෙන්ම මෙය ස්ථිරවම සහතික විය යුතුයි. මොහුට දාදා යැයි අමතන්නේ ඒ නිසයි. ඔබට මෙම ශ්‍රද්ධා විශ්වාසය ඇති අතර ඒ තුළින් ඔබ ඉදිරියට යයි. පරම පියාම ඔහු මේ ඇතුල්වී සිටින කෙනා ගැන මෙසේ කියයි මොහුගේ බොහෝ උපත් වල අවසානයේ දී මම මොහු තුළට ඇතුල් වෙමි. මෙය ගීතාවේ ඥානය බව ඔබ දරුවන්ට විස්තර කර ඇත, එය සියලු ආගමික ලේඛණ වල මාණික්‍යය වූ උසස්ම ලේඛනයයි. ශ්‍රීමත් යන්නෙහි තේරුම ඉහළම උපදෙස් යන්නයි. ඉහළම උපදෙස් එන්නේ ඉහළම ඉහළ පරමාත්ම දෙවියන් ගෙනි. ඔහුගේ ශ්‍රීමත් අනුගමනයෙන් ඔබ සාමන්‍ය මිනිසුන් බවින් දේවි දේවතා බවට පත්වේ. දූෂිත වූ මනුෂ්‍යයන් බවින් ඉහළම ඉහළ දේවි දේවතාවුන් බවට පත්වේ. ඔබ මෙහි එන්නේ ඒ නිසාය. පියාම මෙසේ කියයි මා එන්නේ ඔබව පාපයෙන් තොර දේවි දේවතාවුන් බවට එසවීමටයි. ‘මනුෂ්‍යයන් බවින් දේවි දේවතාවුන් බවට වෙනස් කිරීම’ යන්නෙහි අදහස තේරුම් ගත යුතුව ඇත. පාපකාරී මනුෂ්‍යයන් බවින් පාපයෙන් තොර දේවි දේවතාවුන් බවට වෙනස් කිරීමට ඔහු පැමිණෙයි. ස්වර්ණමය යුගයේ සිටින්නේ මනුෂ්‍යයින්ම වන නමුත් ඔවුන්ට දිව්‍යමය ගුණාංග ඇත. දැන් කළියුගයේ සිටින්නේ එහි යක්ෂ ගති ගුණ ඇති අයයි. මේ දෙකම මනුෂ්‍ය ලෝක වන නමුත් ඔවුන්ට ඇත්තේ දිව්‍යමය බුද්ධි වන අතර මෙහෙ මිනිසුන්ට ඇත්තේ යක්ෂ බුද්ධීන්ය. එහි ඥානය වන අතර මෙහි ඇත්තේ භක්තියයි. ඥානය හා භක්තිය එකිනෙකින් දුරස්ය. බලන්න භක්ති මාර්ගයේ කොපමණ ඇත්ද?, ඥාන මාර්ගයේ ඇත්තේ කොපමණ ද? කියා. පරම පියා ඥාන සාගරයයි. ඔහුට ඇත්තේ එක ලේඛනයකි. ආගමක් ස්ථාපනය කරන කෙනෙකුට එක් ලේඛනයක් තිබිය යුතුයි. එයට ආගමික ග්‍රන්ථය යැයි කියයි. පළමු ආගමික ග්‍රන්ථය වූ කලී ගීතාවයි ශ්‍රීමත් භගවත් ගීතාව. ඔබ දරුවන් දන්නවා පළමුවෙන්ම ඇත්තේ හින්දු ආගම නොව ආදී සනාතන දේවි දේවතා ධර්මයයි. මිනිසුන් විශ්වාස කරන්නේ ගීතාව තුළින් හින්දූ ආගම හැදුණු බවත් ක්‍රිෂ්ණා ගීතාව දේශනා කළ බවත්ය. ඔබ යමෙකුගෙන් ඇසුවද ඔවු කියන්නේ ක්‍රිෂ්ණා විසින් ගීතාව කියන ලද බවයි. කිසිම ලේඛනයක ‘ශිව දෙවියන් කතා කරයි’ යන්න සඳහන්ව නැත. ඔවුන් ලියා ඇත්තේ ‘ශ්‍රී ක්‍රිෂ්ණා දෙවියන් කතා කරයි’ යනුවෙනි. ගීතාව හැදෑරූ කෙනෙකුට මෙය පහසුවෙන්ම තේරුම් ගත හැක. ඔබ දැන් තේරුම් ගෙන සිටිනවා, පරම පියා ඔබට මේ දැන් දෙන ඥානය වන ගීතා ඥානයෙන් මිනිසුන් දේවි දේවතාවුන් වූ බව. ඔහු උගන්වන්නේ රාජයෝගාවයි. ඔහු පාරිශුද්ධිය ද උගන්වයි. කාම රාගය ලොකුම හතුරාය. ඔබ පරාද වූයේ ද එයින්ය. එය ජය ගැනීමෙන් දැන් ඔබ ලෝකයම ජයගෙන එහි හිමිකරුවන් වෙයි. මෙය ඉතා පහසුය. අසීමිත පියා මොහු තුළින් ඔබට උගන්වයි. ඔහු සියලු ජීවාත්මයන්ගේ පියාය. මොහු මනුෂ්‍යයින්ගේ අසීමිත පියාය. මොහුගේ නම ප්‍රජාපිතා බ්‍රහ්මාය. ඔබ කෙනෙකුට කිව්වොත් බ්‍රහ්මාගේ පියා කවුද? කියන්න කියා, ඔහු පටලැවිල්ලට පත් වෙනු ඇත. බ්‍රහ්මා, විෂ්ණු සහ ශංකර් යන නිර්මාණයේ කවුරු හෝ මේ තුනේ ද පියා විය යුතුය. ඔබ පෙන්වා දෙනවා මේ තුනේම පියා අශරීරික පරමාත්ම පියා බව. බ්‍රහ්මා, විෂ්ණු සහ ශංකර් සූක්ෂම කලාපයේ දේවි දේවතාවන් බව පෙන්වයි. ශිවා සිටින්නේ ඔවුන්ට ඉහළිනි. ඔබ දරුවන් දන්නවා ශිව බාබාගේ දරුවන් වන සියලු දෙනාට ඔවුන්ගේම වූ ශරීර ඇති බව. ඔහු වූ කලී උත්තරීතර ජීවාත්මය වන අශරීරික වූ උත්තරීතර පියාය. ඔබ දරුවන් දන්නවා ඔබ අශරීරික උත්තරීතර පියා වන උත්තරීතර ජීවාත්මයේ දරුවන් බව. ශරීරය මඟින් ජීවාත්මය මෙසේ පවසයි උත්තරීතර ජීවාත්මය, උත්තරීතර පියා! මේවා ඉතා පහසු කරුණුය. මේවා අයනු ආයනු යැයි කියැවේ. දැන් ඔබට උගන්වන්නේ කවුද? ගීතාවේ ඥානය කිව්වේ කවුද? අශරීරික පියාය.

ඔහු ඔටුණු ආදිය නොපළඳියි. ඔහු වූ කලී සජීවී කෙනා වන අතර බීජය ද, ඥාන සාගරය ද වේ. ඔබ ද සජීවී ජීවාත්මයන්ය. ඔබ මුළු ලෝක වෘක්ෂයේ මුල, මැද, අග දනී. ඔබ උයන්පල්ලෝ නූතනත් බීජයක් පැළ කර එයින් ගසක් හැදෙන හැටි දනී. ඒවා ජීවමය නොවන ගස් වන අතර මෙය ජීවමය වෘක්ෂයකි. ඔබට මේ ඥානය ඇත. වෙනත් ජීවාත්මයන්ට මේ ඥානය නැත. පරමාත්ම පියා වූ කලී ජීවමය මනුෂ්‍ය ලෝක වෘක්ෂයේ ජීවමය බීජයයි. ඒ නිසා මේ වෘක්ෂය වූ කලී මනුෂ්‍යයින් පිළිබඳ වූ වෘක්ෂයයි. මෙය සජීවී නිර්මාණයයි. බීජයත් නිර්මාණයත් අතර වෙනසක් ඇත. ඔබ අඹ ඇටයක් පැළ කර ගස ලොකු වූ කල අඹ ලැබේ. එසේම මනුෂ්‍ය බීජයෙන් බොහෝ මනුෂ්‍යයින් බෝවේ. ජීවමය නොවන වෘක්ෂයන්ට ඥානය නොමැත. ඔහු වූ කලී ජීවමය බීජයයි. ඔහුට මුළු ලෝක වෘක්ෂය පිළිබඳ ඥානය ඇත. ඔහු ගස නිර්මාණය වූ සැටිත් පවතින ආකාරයත්, විනාශවන අකාරයත් දනී. මේ මහා වෘක්ෂය අවසාන වන විදිය සහ නව එකක් වැවෙන විදිහ අදෘෂ්‍යමානය. ඔබ ලබන ඥානය ද අදෘෂ්‍යමානය. පරම පියා එන්නේ ද අදෘෂ්‍යමාන ආකාරයෙන්ය. ඔබ දන්නවා දැන් පැළය ඉන්දා ඇති බව. දැන් සැම දෙනාම අපවිත්‍ර වී ඇත. අච්චා. හොඳයි බීජයෙන් පළමුවෙන්ම පැන නඟින්නේ කුමන පත්‍රය ද? ලක්ෂ්මී නාරායන නොව ශ්‍රී ක්‍රිෂ්ණාය ස්වර්ණමය යුගයේ පළමු ශාක පත්‍රය වන්නේ. මුලින්ම පළමු ශාක පත්‍රය කුඩා වන අතර පසුව විශාල වී වර්ධනය වේ. ඒ නිසා බීජය පිළිබඳ මහත් පැසසුම් ඇත. එය ජීවමය වන අතර අන් ශාක පත්‍රද මතු වේ. ඒවා ද පැසසිය යුතුය. ඔබ දැන් දේවී දේවතාවුන් බවට පත් වෙමින් සිටී. ඔබ දිව්‍යමය ගුණාංග උකහා ගනිමින් සිටී. ප්‍රධාන කරුණ වන්නේ ද ඔබ දිව්‍යමය ගුණාංග ලබා ඔවුන් මෙන් වීමයි. ඔවුන්ගේ ප්‍රතිමා ඇත. පිංතූර නොතිබුණේ නම් මේ ඥානය ඔබේ බුද්ධියට ඇතුළු නොවනු ඇත. භක්ති මාර්ගයේ දී මේ පිංතූර වලට වඳින අතර ඥාන මාර්ගයේ දී මේ පිංතූර වලින් ඥානය ලබා ඔවුන් හා සමාන වනු ඇත. භක්ති මාර්ගයේ දී ඔබ ඔවුන් හා සමාන විය යුතු යැයි නොසිතයි. භක්ති මාර්ගයේ දී බොහෝ සිද්ධස්ථාන නිමවා ඇත. වැඩියෙන්ම පිහිටුවා තිබෙන්නේ කාටද? එය නියතයෙන්ම බීජය වන ශිව බාබාට විය යුතුය. ඊළගට පළමු නිර්මාණයට සිද්ධස්ථාන හදයි. පළමු නිර්මාණය වන්නේ ලක්ෂ්මී නාරායන්ය. ශිවාට පසුව වැඩියෙන්ම වන්දනා ලබන්නේ ඔවුන්ය. මව්වරුන් ඥානය දෙන නමුත් ඔවුන් වන්දනාවට ලක් නොවේ. ඔවුන් කරන්නේ ඉගැන්වීමයි. උගන්වමින් සිටින්නේ පරමාත්ම පියාය. ඔබ කිසිවෙකුට වන්දනා නොකරයි. මෙකළ උගන්වන අයට ඔබ වන්දනා කළ යුතු නැත. මේ අධ්‍යයනය හමාර වී එය අමතක වූ කල වන්දනාව පටන් ගනී. ඔබ එම දේවී දේවතාවුන් බවට පත් වෙමින් සිටී. ඔබ පමණයි දන්නේ පළමුවෙන්ම ඔබව ඔවුන් හා සමාන කළ කෙනා වන්දනා කරන අතර ඉන් ඉක්බිතිව අනුපිළිවලින් ඔබට වන්දනා කරන බව. පසුව කඩාවැටීම නිසා ඔබ මහාභූත පවා වන්දනාවට පටන් ගනී. ශරීරය සෑදී ඇත්තේ මහාභූත පහෙන්ය. මහා භූත පහ වැන්දත් ශරීරයට වැන්දත් එකමය. ඔබ බුද්ධියෙන් දන්නවා ඥානය අනුව ලක්ෂ්මී නාරායන මුළු ලෝකයේම හිමිකරුවන් බව. නව ලෝකය දේවී දේවතාවුන්ගේ රාජධානිය වේ. කොහොමනමුත්, මිනිසුන් ඒ වකවානුව නොදනී. ඔවුන් අවුරුදු සිය දහස් ගැන කියයි. එවැනි කාල සීමාවන් කිසිවකුගේ බුද්ධියට ගෝචර නොවේ. ඔබ දැන් දැනුවත්ව සිටිනවා, අදින් අවුරුදු 5000 කට පෙර ඔබ ආදි සනාතන දේවී දේවතා ධර්මයට අයත්ව සිටි බව. දේවී දේවතා ආගමට අයත් අය පසුව අනෙකුත් ආගම් වලට හැරවුණි. මෙය හින්දු ආගම යැයි නොකිව යුතුය. ඔවුන් අපිරිසිඳු නිසා ඔවුන්ට දේවී දේවතාවුන් යැයි කිව නොහැකිය. අපවිත්‍ර කෙනෙකුට දේවී දේවතා යන්න නොයෙදේ. මිනිසුන් වන්දනා කරන්නේ පාරිශුද්ධ දෙවඟණන්ය. ඒ නිසා එම වන්දනා කරුවන් අපිරිසිඳු බව පෙනේ. ඒ නිසයි ඔවුන් පාරිශුද්ධ අයට හිස නමන්නේ. භාරතයේ කුමාරීන්ට විශේෂයෙන් නමස්කාර කෙරේ, ඔවුන් කුමාර වරුන්ට වන්දනා නොකරයි. ඔවුන් හිස නමන්නේ ගැහැණු පක්ෂයටය. ඔවුන් පිරිමින්ට හිස නොනමන්නේ ඇයි? ඒ මෙකළ පළමුවෙන් ඥානය ලබන්නේ මව්වරුන් නිසාවෙනි. පරම පියා මොහු තුළට ඇතුල් වේ. ඔහුත් දන්නවා ඔහුත් විශාලම ඥාන ගංභාව බව. ඔහු පිරිමි වන අතර ඥාන ගංභාව වේ. ඔහු ලොකුම ගංභාවයි. කල්කටා නගරය අසලදී බ්‍රහ්ම පුත්‍ර ගංභාව සාගරය හා එක්වේ. ලොකුම මේලාව සිදුවන්නේ එහිය. කොහොමනමුත්, ඔවුන් තේරුම් ගන්නේ නැහැ මේ හමුවීම වූ කලී ජීවාත්මත් උත්තරීතර ජීවාත්මයත් හමුවීම බව. බ්‍රහ්ම පුත්‍ර යැයි නම දී ඇත්තේ ජල ගංභාවටය. ඔවුන් කියන්නේ බ්‍රහ්ම් ධාතුව දෙවියන් බවත් ඒ නිසා බ්‍රහ්ම පුත්‍ර ගංභාව පවිත්‍ර යැයි සලකන බවත්ය. එය ලොකුම ගංභාව වන අතර පිරිසිඳු එක ද වේ. ඇත්තම නම් ගංභානම් ගඟ නොව බ්‍රහ්ම පුත්‍ර ගංභාව පාරිශුද්ධකරුවා ලෙස හැඳින්විය යුතු බවයි. මේ ගංභා එකතු වීමයි සිදුවන්නේ. මෙයද සාගරය හා බ්‍රහ්මා ගඟ එකතු වීමකි. බ්‍රහ්මා මඟින් හදාගන්නේ කෙසේද යන්න පිළිබඳ වූ කරුණු තේරුම් ගත යුතු ගැඹුරු කාරණාය. පසුව මේ ඥානය අතුරුදහන් වේ. මේවා ඉතා පහසු දේය. පරමාත්ම දෙවියන් කතා කරයි මම රාජයෝගා උගන්වන අතර ලෝකය අවසන් වේ. සියලු ලේඛන එකක්වත් ඉතිරි නොවේ. මෙම ලේඛන නැවත මතුවන්නේ භක්ති මාර්ගයේ දීය. ඥාන මාර්ගයේ දී ඒවා නැත. මිනිසුන් විශ්වාස කරන්නේ ආගමික ලේඛන අනාදිමත් කාලයක

සිට එන බවයි. ඔවුන්ට ඥානය නැත. ඔවුන් කියන්නේ චක්‍රයේ කාල සීමාව අවුරුදු සිය ගණනක් බවයි. ඒ නිසා එය අනාදිමත් යැයි කියයි. එය අඥාන අන්ධකාරය යැයි හැඳින්වේ. ඔබ දරුවන් දැන් මෙම අසීමිත අධ්‍යයනය තුළින් මුල, මැද, අග රහස් දැන ගනී. ඔබ දේවී දේවතාවන්ගේ සම්පූර්ණ ඉතිහාසය හා භූගෝලය දනී. ඔවුන් පිරිසිඳු ගෘහස්ථ මාර්ගයට අයිති වන අතර වන්දනීයද වේ. දැනට ඔවුන් අපිරිසිඳු වන්දනාකරුවන් බවට පත් වී ඇත. ස්වර්ණමය යුගයේ දී ඇත්තේ පිරිසිඳු පවුල් මාර්ගයයි. මෙහි කළි යුගයේ ඇත්තේ අපිරිසිඳු පවුල් මාර්ගයයි. ඉන් පසුව හුදකලා මාර්ගය ඇත. එයද නාටකය තුළ නියමිතය. එයට අත්හැරයාමේ ආගම යැයි කියැවේ. ඔවුන් ගෙවල් සහ පවුල් අතහැර වනගත වේ. එය සීමිත අත්හැරීමකි. ඔවුන් මෙම ලෝකයේම ජීවත් වේ. ඔබ දන්නවා දැන් ඔබ සංගම යුගයේ බවත් එයින් නව ලෝකයට යන බවත්. ඔබ දින, තත්ත්පර වශයෙන් කාල වකවානු නිවැරදිවම දනී. ඒ මිනිසුන් කියන්නේ චක්‍රයේ කාල සීමාව අවුරුදු සිය දහස් ගනණක් බවයි. එයින් හරි ගණනයක් කළ නොහැකිය. කිසිවෙකුට අවුරුදු සිය දහස් ගණනක් සිහිකළ නොහැකිය. ඔබ දැන් දන්නවා, මුල් පියා කවුදැයි යන්නත්, ඔහු පැමිණ කුමක් කරනවාද යන්නත්. ඔබ හැම කෙනාගේම රැකියාව හා කේන්ද්‍රය දනී. කොහොමනමුත්, ගසක නොගිණිය හැකි තරම් ශාක පත්‍ර ඇත. මේ අසීමිත ලෝක වෘක්ෂයේ පත්‍ර කීයක් තිබේ ද? අවුරුදු 5000 කදී බිලියන 6 කි. ඒ නිසා අවුරුදු සිය දහස් ගණනක දී මිනිසුන් ගණන් කළ නොහැකි තරම් වනු ඇත. භක්ති මාර්ගයේ මෙසේ ලියැවී ඇති බව පෙනේ ස්වර්ණමය යුගයට මෙම අවුරුදු ගණන, රිදී යුගයට මෙම අවුරුදු ගණන, තඹ යුගයට මෙම අවුරුදු ගණන ආදී වශයෙනි. ඒ නිසා පරම පියා මෙහි හිඳ ඔබ දරුවන්ට සිය රහස් විස්තර කර දේ. ඔබ අඹ ඇටයක් දුටු විට අඹ ගසක් සිතට එයි. දැන් මනුෂ්‍ය ලෝක වෘක්ෂයේ බීජය ඔබ ඉදිරිපිට ඇත. ඔහු මෙහි සිට ජීවමය බව නිසා වෘක්ෂයේ සියලු රහස් ඔබට විස්තර කර දේ. මෙම වෘක්ෂය උඩු යටිකුරු බව ඔහු පෙන්වා දෙයි. ඔබට තේරුම් කර දිය හැකියි මේ ලෝකයේ ජීවී අජීවී හැම දෙයක්ම හඳුනාගත හැකි ලෙස ඒ ලෙසින්ම නැවත සිදුවන බව. ජන ගහනය දැන් එතරම්ම වැඩි වෙමින් තිබේ! ස්වර්ණමය යුගයේ දී එතරම් පිරිසක් සිටිය නොහැකිය. ඔබ යම් දෙයක් ඕස්ට්‍රේලියාවෙන් හෝ ජපානයෙන් ගෙනාවයි කීවත් ස්වර්ණමය යුගයේ දී ඕස්ට්‍රේලියා හෝ ජපානය දැකිය නොහැක. නාටක සැලැස්මේ ආකාරයට යම් යම් තැන් වලින් මෙහි යම් යම් දේ එයි. ඇමරිකාවෙන් ධාන්‍ය ආනයනය කරයි. ස්වර්ණමය යුගයේ දී කිසිවක් කොහෙන්වත් ආනයනයක් නොවේ. එහි ඇත්තේ එකම ආගමකි. මෙහි ආගම් තවම වැඩි වෙමින් තිබේ. බලන්න විවිධ ස්ථාන වලින් විවිධ දේ ආනයනය කරන හැටි. අවසානයේ දී මනුෂ්‍යයින් බොහෝ ගණනක් වැඩි වේ. ස්වර්ණමය යුගයේ දී අඩුපාඩු කිසිවක් නැත. එහි සෑම දෙයක්ම සතෝප්‍රධාන් වන අතර ඉතා හොඳය. මනුෂ්‍යයින් ද සතෝප්‍රධාන්ය. මිනිසුන් හොඳ වන විට ඔවුන් අවට සියලු දේ හොඳ වේ. මිනිසුන් නරක වන විට ඔවුන් හාත්පසම නරක වේ. හිංසාකාරී වේ. විද්‍යාවේ ප්‍රධාන දේ නම් මුළු ලොවම විනාශ කරන පරමාණු බෝම්බයයි. ඔවුන් එය සෑදුවේ කෙසේ ද? නාටකයට අනුව එය සෑදූ කෙනාට ඒ ඥානය කල්තියාම තිබී ඇත. ඒ ඥානය කාලය පැමිණි විට මතුවේ. එවැනි තේරුමක් ලැබූ අය අන් අයට ද එය උගන්වයි. හැම චක්‍රයකම ඉටු කරන ලද කොටස කුමක් ද එසේම එම කොටස දිගටම ඉටු වීම සිදුවේ. ඔබ දැන් ඥානයෙන් පිරෙමින් සිටී. මීට වඩා මහත් වූ ඥානයක් නැත. මේ ඥානයෙන් ඔබ දේවී දේවතාවුන් බවට පත් වේ. මේ ඥානයට වඩා උසස් වෙනත් ඥානයක් නැත. ඒ මායාවේ ඥානය විනාශය සඳහාය. හඳේ පර්යේෂණයට යන විද්‍යාඥයන් ඇත. එය ඔබට අළුත් දෙයක් නොවේ. ඒ සියල්ල මායාවේ පම්පෝරියයි. ඔවුන් ගැඹුරට යමින් බොහෝ සෙයින් බාහිර වූ පෙනුම පෙන්වයි. බොහෝ මිනිසුන් යම් යම් පුදුම දේ කිරීම සඳහා බුද්ධිය අනවශ්‍ය සේ මහන්සි කරති. එවැනි පුදුම දේ කිරීමෙන් විශාල හානි සිදු කරයි. බලන්න ඔවුන් සොයාගනිමින් සිටින දේවල්! ඒවා සාදන අය ඒවා තුළින් විනාශයක් සිදුවන බව දනී. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. නොපෙනෙන ඥානය කලඹමින් උද්යෝගිමත්ව සිටින්න. ඔබ ඉදිරියේ ඇති දේවී දේවතාවුන්ගේ පිංතූර බලන්න. ඔවුන්ට වන්දනා කරනවා වෙනුවට ඔවුන් සේ වන්නට දිව්‍යමය ගුණාංග උකහා ගන්න.
2. ලොවෙහි බීජය වන පරමාත්ම පියා සහ ඔහුගේ ජීවමාන නිර්මාණය වටහා ගෙන ඥානයෙන් පිරි බවට පත් වන්න. මෙම ඥානයට වඩා උසස් තවත් ඥානයක් නැතැයි යන්න ගැන කුල්මත්භාවය පවත්වා ගන්න.

**වරදානය:** එකම එක පියාට පමණක් අයත් වීම සහ අන් කිසිවෙකුට අයත් නොවීම යන පාඩම පිළිබඳව අවධානයෙන් සිට ඔබේ මනෝ ස්ථිතිය නිත්‍ය සහ අචල කර ගැනීමෙන් ඔබ උසස් ජීවාත්මයක් බවට පත් වේවා.

ඔබ නිරන්තරව එකම එක පියාට පමණක් අයත් වීම සහ අන් කිසිවෙකුට අයත් නොවීම යන පාඩම අවධානයේ තබා ගන්නේ නම්, ඔබේ මනෝ ස්ථිතිය නිත්‍ය හා අචල වනු ඇත, මන්ද, ඔබට මෙම සියලු දැනුම ලැබී ඇත. බොහෝ කරුණු තිබෙන නමුත්, ඒ සියලු කරුණු ඇතිව සිටියදී යමෙකු ඔබව පහළට අදිද්දී තිතක ස්වරූපයේ ස්ථාවරව සිටීම විශ්මයකි. සමහර විටෙක අවස්ථාවන් ඔබව පහළට අදීවි; සමහර විටෙක මිනිසුන් ඔබව පහළට අදීවි; විටෙක දේවල් ඔබව පහළට අදීවි; තවත් විටෙක වාතාවරණය ඔබව පහළට අදීවි. මේ කුමන ලෙසකින් හෝ එය සිදුවනු ඇති නමුත්, මේ සියලු ව්‍යාජතීන් තත්පරයකින් අවසන් වී, ඔබට නිත්‍ය හා අචල මනෝ ස්ථිතියක් ඇති විට පමණක්, ඔබ උසස් ජීවාත්මයක් වීමේ ආශීර්වාදය ලැබූ ජීවාත්මයක් යැයි කියනවා ඇත.

**පාඨය:** බාධක ඔබට පහර දෙන විට, ඔවුන් පරාජය කරනු ලබන පරිදි මෙම දැනුමේ බලය උකහා ගන්න.

***** ඕම් ශාන්ති *****

**අව්‍යාක්ත සංඥාව: මෙම අව්‍යක්ත මාසයේ, බන්ධනයෙන් නිදහස් වී ජීවන මුක්ති අවධිය අත්විඳින්න.**

දැන්, ඔබ සියලු දෙනාම මුක්තිය ලබා මාස්ටර් මුක්ති දානපති බවට පත්ව සියලු ජීවාත්මයන්ට, බැතිමතුන්ට සහ සොබාදහමේ පදාර්ථයන්ට මුක්තිය දානය කරන්න. බ්‍රහ්ම පියා දැන් මේ එක දෙයක් ගැන සැලකිලිමත්ව සිටී: මගේ සෑම දරුවෙකුම ජීවන මුක්තිය ලබන්නේ කවදාද? ජීවන මුක්තිය අවසානයේ දී ලබනු ඇතැයි නොසිතන්න; නැත. දිගු කාලයක් තිස්සේ ජීවන මුක්ති අවධිය පුහුණු කිරීමෙන් ඔබට ජීවන මුක්තියේ අයිතිය සහ රාජ්‍යයේ වාසනාව දිගු කාලයක් පුරාවට ලබා ගැනීමට හැකි වේ.